සියලුම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

# පළමු වාර පරීක්ෂණය 2018

# නාට්‍ය හා රංග කලාව

7 ශ්‍රේණිය

කාලය පැය 02 යි.

නම/ විභාග අංකයඃ

## I - කොටස

- ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.
- නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

01 ළමයින් විසින් කුඩා කල සිදුකරන නාට්‍යමය ක්‍රියාකාරකමකි,

(i) බට්ටා පැනීම (ii) සෙල්ලම් ගෙවල් සෑදීම

(iii) බයිසිකල් පැදීම (iv) බෝල ගැසීම

02 නාට්‍යයක සංවාද භාවිතය අයත් වන්නේ,

(i) ආංගික අභිනයටයි. (ii) වාචික අභිනයටයි.

(iii) සාත්වික අභිනයටයි. (iv) ආහාර්ය අභිනයටයි.

03 ළමා නාට්‍යයක් <u>නොවන්නේ</u>,

(i) නරි බෑණා (ii) වලහා සහ මාෂා

(iii) තොප්පි වෙළෙන්දා (iv) පුංචි අපට දූන් තේරෙයි

04 ''ඇලඩින්ගේ පුදුම පහන'' යනු,

(i) වීර කතාවකි. (ii) ඉතිහාස කතාවකි.

(iii) ජන කතාවකි. (iv) සුරංගනා කතාවකි.

05 රූපණය යනුවෙන් හඳුන්වන්නේ,

(i) නර්තනයයි. (ii) රංගනයයි. (iii) වාදනයයි. (iv) ගායනයයි.

- **06 - 10 දක්වා ප්‍රශ්නවලට ගැලපෙන පිළිතුර වරහන් තුළින් තෝරා හිස්තැන් පුරවන්න.**

(දුටුගැමුණු / හඬ / ගජබා / ආහාර්ය / ජන / රංගනය)

06 සංවාද උච්චාරණයේ දී ........................................ ප්‍රභලව පැවතිය යුතුය.

07 කපුටා සහ කේජු කැල්ල ................................................ කතාවකි.

08 කය, මනස අතර මනා සම්බන්ධතාවයක් ගොඩනැගීම මගින් .................................... සාර්ථක කර ගත හැක.

09 ඇඳුම්, පැළඳුම්, ආභරණ යනාදිය .............................................. අභිනයට අයත් වේ.

10 වැලි මිරිකා දිය ගෙන පෙන්වූයේ .............................................. රජතුමාට ය.

- **11 - 15 දක්වා ප්‍රශ්න කියවා හරි නම් (✓) ලකුණ ද, වැරදි නම් (×) ලකුණ ද වරහන් තුළ යොදන්න.**

11 ප්‍රධාන රංග භූමි වර්ග දෙකක් ඇත. ( )

12 එකම චරිතයක් තුළ භූමිකා කීපයක් ඇත. ( )

13 ''කොට්ටා පොරය'' ජන ක්‍රීඩාවකි. ( )

14 සෑම නාට්‍යයකම තේමාවක් නැත. ( )

15 ''කුවේණි'' වේදිකා නාට්‍යයකි. ( )

- **16 - 20 දක්වා ප්‍රශ්න සඳහා පහත දී ඇති ප්‍රහේලිකාව පුරවන්න.**

<u>හරහට</u>

16 ළමා නාට්‍යයකි.


18 නළු නිළියන් කරන අභ්‍යාස මෙසේ හඳුන්වයි.

20 ගෘහස්ථ ජන ක්‍රීඩාවකි.

<u>පහළට</u>

16 පුද්ගලයෙකුගේ හෝ සත්වයකුගේ ස්වභාවය එලෙසින්ම කිරීම මෙසේ හඳුන්වයි.

19 වචන භාවිතයෙන් තොරව කරන නිරූපණ මෙනමින් හඳුන්වයි.



## II කොටස

- පළමු ප්‍රශ්නය අනිවාර්යය වේ. පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න තුනකට පිළිතුරු සපයන්න.

01



ඉහත පින්තූරයේ දැක්වෙන්නේ ඔබ පන්ති කාමරයේ දී නිරත වූ කණ්ඩායම් ක්‍රියාකාරකමක අවස්ථාවකි.

(i) ඔබ නිරත වූ එම ක්‍රියාකාරකම කුමක් ද? (ලකුණු 02)

(ii) එහි දක්නට ලැබුණු නාට්‍යමය ලක්ෂණ මොනවා ද? 4 ක් ලියන්න. (ලකුණු 04)

(iii) එම ක්‍රියාකාරකමෙහි යෙදීමට ඔබ සියලුදෙනා සූදානම් වූ ආකාරය විස්තර කරන්න. (ලකුණු 04)

02 නාට්‍යයක් රඟ දක්වන ඕනෑම ස්ථානයක් ''රංග භූමිය'' ලෙස හඳුන්වයි.

(i) ඔබ දන්නා රංග භූමි වර්ග 2 ක් ලියන්න. (ලකුණු 02)

(ii) රංග භූමියක දක්නට ලැබෙන ලක්ෂණ 3 ක් ලියන්න. (ලකුණු 03)

(iii) රංග භූමියක රූප සටහනක් ඇඳ කොටස් නම් කරන්න. (ලකුණු 05)

03 රංග අභ්‍යාස නළුවෙකුට ඉතා අවශ්‍යය වේ.

(i) රංග අභ්‍යාස යනුවෙන් හඳුන්වන්නේ මොනවා ද? (ලකුණු 02)

(ii) ඔබ දන්නා රංග අභ්‍යාස වර්ග 4 ක් ලියන්න. (ලකුණු 02)

(iii) පංති කාමරයේ දී ඔබ සිදුකළ රංග අභ්‍යාස වර්ගයක් නම්කර එහි නිරත වූ ආකාරය ලියා දක්වන්න. (ලකුණු 06)

04 ඓතිහාසික කතා තුළින් රසවත් නාට්‍ය නිර්මාණ ගොඩනැගීමට හැකියාව ඇත.

(i) ඔබ දන්නා ඓතිහාසික කතා 4 ක් නම් කරන්න. (ලකුණු 02)

(ii) ඓතිහාසික කතා ඇතුලත් ග්‍රන්ථ 4 ක් නම් කරන්න. (ලකුණු 02)

(iii) ඓතිහාසික කතා ඇතුළත්
- චිත්‍රපට 2 ක් සහ
- වේදිකා නාට්‍ය 2 ක් නම් කරන්න. (ලකුණු $3 \times 2 = 06$)

05 පහත දැක්වෙන කතන්දර අතරින් එකක් තෝරාගෙන සරළ නාට්‍ය පිටපතක් ලියන්න.

(i) පුහුල් හොරා කරෙන් දැනෙයි. (ii) ගමරාළ දිව්‍ය ලෝකේ ගියා වගෙයි.

(iii) ඉබ්බා අහසින් ගිය හැටි (iv) කපුටා සහ කේජු කැල්ල

(v) හාවාගේ ලබු කිරිබත් (ලකුණු 10)

## පිළිතුරු පත්‍රය - I කොටස

(01) ii (02) ii (03) i (04) iv (05) ii (06) හඬ (07) ජන
(08) රූපණය (09) ආහාර්ය (10) ගජබා (11) ✓ (12) ✓ (13) ✓
(14) × (15) ✓ (16) අමර ගියා දිව්‍ය ලෝකේ (17) අනුකරණය (18) රංග අභ්‍යාස
(19) අභිරූපණ (20) පංච දෑමීම

## II කොටස

01 (i) සෙල්ලම් ගෙයක් සෑදීම (ල. 02)

(ii) අනුකරණය, සමාරෝපය, සංවාද භාවිතය, රංග වස්ත්‍ර භාවිතය ආදී පිළිතුරු සඳහා ලකුණු ලබාදෙන්න. (ල. 04)

(iii) ක්‍රියාකාරකම පිළිබඳ විස්තර කර ඇත්නම් ලකුණු ලබාදෙන්න. (ල. 04)

02 (i) එළිමහන් රංග භූමි / ගෘහස්ථ රංග භූමි / කැරකෙන වේදිකා / කවාකාර වේදිකා / අර්ධ කවාකාර වේදිකා / කමත / කරළිය / තානායම්පොළ (ල. 02)

(ii) සමතලා භූමියක් විය යුතුයි / රඟපෑමට ප්‍රමාණවත් අවකාශයක් තිබිය යුතුයි / නළු නිළියන්ට අවශ්‍ය අවම පහසුකම්වත් තිබිය යුතුයි..... ආදී වශයෙන් නිවැරදි පිළිතුරු ලියා ඇත්නම් ලකුණු ලබාදෙන්න. (ල. 03)

(iii) නිවැරදි රූප සටහනට ලකුණු දෙන්න. (ල. 05)

03 (i) රඟපෑමේ නිරතවන නළු නිළියන් කරනු ලබන අභ්‍යාස රංග අභ්‍යාස වේ. (ල. 02)

(ii) ශ්වසන අභ්‍යාස / සංවේදන අභ්‍යාස / හඬ අභ්‍යාස / ශිථිලකරණ අභ්‍යාස නිවැරදි පිළිතුරු සඳහා ලකුණු ලබාදෙන්න. (ල. 02)

(iii) නිවැරදි පිළිතුර සඳහා ලකුණු ලබාදෙන්න. (ල. 06)

04 (i) විජය කුවේණි / පණ්ඩුකාභය වැනි ඓතිහාසික කතා (ල. 02)

(ii) දීප වංශය, චූලවංශය, මහාවංශය, පන්සිය පනස් ජාතකය, රාජරත්නාකරය (ල. 02)

(iii) නිවැරදි පිළිතුර සඳහා ලකුණු ලබාදෙන්න. (ල. 06)

05 නාට්‍ය පිටපතට අනුව ලකුණු ලබාදෙන්න. (ල. 10)